00066

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**පෙරපාසල් අධ්‍යාපන උසස් සහතික පත්‍ර වැඩසටහන - 2014**

**ළමා අයිතිවාසිකම් - ESC 2222**

**කාලය - පැය තුනයි.**

---

දිනය - 2014.10.25 වේලාව - ප.ව. 01.30- ප.ව.04.30 දක්වා

---

**පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලට සහ දෙවන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට ද (03) පිළිතුරු සපයන්න.**

**I - කොටස**

01. "ළමයා" යන පදය නිර්වචනය කරන්න.

02. විශේෂ අධ්‍යාපන සහිත දරුවන්ගේ පවුලේ භූමිකාව කෙටියෙන් විස්තර කරන්න.

03. ළමුන් හා සම්බන්ධ අයිතීන් , අවශ්‍යතා සහ යුතුකම් යන පදවල වෙනස්කම් පැහැදිලි කරන්න.

04. ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රධාන තොරතුරු ලබන්නන් සහ තොරතුරු ලබා දෙන්නන් පහක් (05) ලැයිස්තු ගත කරන්න.

05. ළමා අයිතිවාසිකම් යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ශ්‍රී ලංකාවේ වෙන්කොට නොසැලකීමේ ප්‍රතිපත්තිය කෙරෙහි ආගම කෙසේ බලපෑමක් කරන්නේ ද?

07. "විශේෂ අවශ්‍යතා " යන පදය නිර්වචනය කරන්න.

08. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය විසින් පිළිගන්නා ලද සහභාගිත්ව අයිතිවාසිකම් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x8 = 40)

## II කොටස

09. (a) ඕලන්ද යුගය
(b) බ්‍රිතාන්‍ය යුගය
යන යුගයන්වලදී ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් සම්බන්ධයෙන් ගනු ලැබූ ප්‍රධාන ක්‍රියාමාර්ග කෙටියෙන් පැහැදිලි කරන්න. ( 2 x 10 = ලකුණු 20)

10. (a) ළමා අයිතිවාසිකම ප්‍රඥප්තියෙන් , සඳහන් ළමා අයිතිවාසිකම්වලට අදාළ 'පොකුර' ලැයිස්තු ගත කරන්න. (ලකුණු 05)

(b) රොෂාන් ට වයස අවුරුදු 10 කි. ඔහුගේ පියා ශ්‍රී ලාංකිකයකු නොවන අතර ඔහුගේ මව ශ්‍රී ලාංකික පුරවැසියෙකි. රොෂාන්ගේ දෙමාපියන් 2002 විවාහ වී ඇති අතර රොෂාන් ගේ උපතින් පසුව ඔවුන් ගල්කිස්ස ප්‍රදේශයේ ජීවත්වීමට තීරණය කරන ලදී. රොෂාන් දෙහිවල පිහිටි පෞද්ගලික පාසලකට ඇතුළත් කළ අතර ක්‍රීඩා පිළිබඳ සුවිශේෂ හැකියාවක් දක්වන ලදී. පාසලේ ජාතික ක්‍රීඩා තරඟ කණ්ඩායමේ සාමාජිකයකු ලෙස නියෝජනය කළාවුවද ඔහු ශ්‍රී ලාංකික පුරවැසියකු නොවන බැවින් ඔහුට තරඟ සඳහා සහභාගිවීමේ අවස්ථා ප්‍රතික්ෂේප විය. ශ්‍රී ලංකාව ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියට අත්සන්කරුවෙකු යන සත්‍ය හරහා මෙම තීරණය පරීක්ෂා කරන්න.

මෙය සාධාරණ තීරණයක් ලෙස ඔබ සිතන්නේ ද? (ලකුණු 15)

11. (a) ළමා පැවැත්ම, වර්ධනය සහ සංවර්ධනය සඳහා ළමා ආරක්ෂණය සේවා දියුණු කිරීමට අදාළ පවුලෙන් ලැබෙන ආධාරය සහ දරිද්‍රතාව තුරන් කිරීම ආධාර වන්නේ කෙසේ ද?

(b) පැවැත්ම, වර්ධනය සහ සංවර්ධනය සඳහා අධ්‍යාපනයේ භූමිකාව පැහැදිලි කරන්න.
( 10x 2= ලකුණු 20)

12. (a) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් වැඩි දියුණු කිරීමෙහි ලා රජය මගින් ගනු ලැබූ පියවර හතරක් (04) ක් ලියන්න.
(ලකුණු 10)

(b) ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් තවදුරටත් දියුණු කිරීම සඳහා පියවර කිහිපයක් ගත හැකිය. ඉන් පහක් (05) ලැයිස්තු ගත කරන්න.
(ලකුණු 10)

13. ඕනෑම **දෙකක් (02)** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
(i) ළමා කම්කරු සේවය
(ii) වීදි ළමුන්
(iii) යටත් විජිත යුගයට පෙර අවධිවල ළමා අයිතිවාසිකම්
( 10 x 2 = ලකුණු 20)

- හිමිකම් ඇවිරිණි. -

THE OPEN UNIVERSITY OF SRI LANKA

FACULTY OF EDUCATION

FINAL EXAMINATION – 2014

ADVANCED CERTIFICATE IN PRE-SCHOOL EDUCATION PROGRAMME

ESC2222 – CHILD RIGHTS

DURATION – THREE (03) HOURS.

Date: 25th October 2014 Time: 1.30 p .m. – 4.30p.m.

Answer all questions in **Part I** & three (03) questions from **Part II**.

## PART I

01. Define the term 'child'.

02. Explain in brief the role of the family in relation to children with special needs.

03. Differentiate between the terms Rights, Needs and Duties towards children

04. List out **five (05)** main recipients and purveyor of information in Child Rights.

05. Explain 'Child Rights' in brief.

06. How does religion affect the upholding of the principle of non-discrimination in Sri Lanka?

07. Define the term 'Special Needs'

08. Describe the participatory rights recognized by United National Convention (CRC) on Child Rights.

(5 x 8 = 40 marks)

## PART II

09. Explain in brief the main actions taken relevant to Child Rights in Ceylon (Sri Lanka) during the

 a. Dutch Period

 b. British Period.

(10 x 2 = 20 marks)

10. i. List the clusters of child rights as set out in the convention on Child Rights. (CRC).

(05 marks)

 ii. Roshan is 10 years old. His father is a non-national and his mother is a Sri Lanka citizen. Roshan's parents had married in 2002 and decided to reside in Mount Lavinia after Roshan was born. Roshan gained admission to a private school in Dehiwala and expected in sports. His school sent him as a member of national sports competition. However, he was denied to the chance to compete because he was a non citizen.

 Examine this decision from the point of view of Child Rights and the fact that Sri Lanka is a signatory convention on Child Rights.

 Do you think this is a fair decision.

(15 marks)

11. i. How does family support for poverty alleviate that will help to improve child care for survival, growth and development.

(10 marks)

 ii. Explain the role of education for survival and growth and development.

(10 marks)

12. i. Write **four (04)** steps taken by government of Sri Lanka to improve the Child Rights in the country.

(10 marks)

ii. Several measures could be taken towards the further promotion of Child Rights in Sri Lanka. List out any **five (05)** measures.

(10 marks)

13. Write short notes on any **two (02)** of the following.

i. Child labour

ii. Street children

iii. Child Rights in pre-colonial period.

(2 x 10 = 20 marks)

*-Copyrights reserved -*